# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 116/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 22/01/2024<br>පැය 1550 |

## මාධ්‍ය නිවේදනය

**CCTV කැමරා මඟින් රථවාහන වැරදි නිරීක්ෂණය කර රථවාහන හිමිකරුවන් වෙත දඩපත් යැවීමේ නියමු ව්‍යාපෘතිය ආරම්භ කිරීම - සමීපරූප ආවේක්ෂණ කොට්ඨාසය.**

CCTV කැමරා මඟින් රථවාහන වැරදි නිරීක්ෂණය කර රථවාහන හිමිකරුවන් වෙත දඩපත් යැවීමේ නියමු ව්‍යාපෘතිය ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජෙනරාල් නිශාන්ත අනුරුද්ධ වීරසිංහ මහතාගේ සහ වැඩබලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සහභාගිත්වයෙන් **2024.01.22** වන අද දින උදෑසන **සී.සී.ටී.වී. කොට්ඨාසයේ දී** ආරම්භ කරන ලදි.

මෙම නියමු ව්‍යාපෘතිය තුලින් කොළඹ ප්‍රදේශයේ ස්ථාපිත කර ඇති සී.සී.ටී.වී. කැමරා මඟින් රථවාහන වැරදි සිදුකරන රියදුරන් නිරීක්ෂණය කර එම වාහන වල ලියාපදිංචි අංක මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී එම රථවාහන වල හිමිකරුවන් හඳුනාගෙන ඔවුන් වෙත දඩ පත්‍ර යැවීම මෙමඟින් අපේක්ෂිතය. ඒ අනුව රථවාහන වරදට අදාළ සී.සී.ටී.වී. දර්ශන පටය සමීප රූප ආවේක්ෂණ කොට්ඨාසය මඟින් වාහනය ලියාපදිංචි ලිපිනයට අදාළ පොලිස් ස්ථානය වෙත යොමු කර වරද සිදු කළ රියදුරු දැනුවත් කරනු ලබන අතර ඔහු විසින් සිදු කළ වරදෙහි වීඩියෝ දර්ශනය නිරීක්ෂණය කිරීමට ද හැකියාව ඇත. ඉන් අනතුරුව ඔහුට රථ වාහන වරදට අදාල දඩ පත්‍රිකාව අදාල පොලිසිය මඟින් ලබා ගැනීමට හැකියාව ඇත.

රියදුරන් දැනුවත් කිරීම සඳහා කොළඹට ප්‍රවේශවන මාර්ග වල **“විනීත රියදුරන් පොලිස් සී.සී.ටී.වී. කැමරා ඉදිරියේ සුරක්ෂිතයි”** ලෙස සඳහන් පුවරු 09ක් ස්ථාපිත කර රථ වාහන රියදුරන් දැනුවත් කිරීමට ද කටයුතු කර ඇත.

සමීප රූප ආවේක්ෂණ කොට්ඨාසය මඟින් ලබා ගන්නා රථවාහන වැරදි වලට අදාල රියදුරන්ට සතියක කාලයක් අවවාද කිරීමට කටයුතු කරන අතර 2024 පෙබරවාරි මස 01 වන දින සිට දඩ පත්‍රිකා නිකුත් කිරීම සිදු කරනු ලබයි.